UNIVERSITY.OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - 2020
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2020

දේශපාලන විද්‍යාව/Political Science

**PSC 202 – දේශපාලන සහ සමාජ න්‍යාය (නව විෂය නිර්දේශය)**

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් හිමි වේ.

මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.

ප්‍රශ්න (05) **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

කාලය පැය (03) **තුනක්** පමණයි.

---

01. දේශපාලන සහ සමාජ න්‍යාය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

02. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් විසින් ඉදිරිපත් කරන ලද "ස්වභාවික නීතිය පිළිබඳ සංකල්පයේ" සහ "ස්වභාවික යුක්තිය පිළිබඳ සංකල්පයේ" ප්‍රධාන ලක්ෂණ සංක්ෂිප්ත කර දක්වන්න.

03. නූතන ලිබරල්වාදයේ සහ නව ලිබරල්වාදයේ ගතිලක්ෂණ හඳුනා ගන්න.

04. වී. අයි. ලෙනින් විසින් සමාජවාදයට හඳුන්වා දෙනු ලැබූ "අධිරාජ්‍යවාදී ධනවාදය පිළිබඳ සංකල්පයේ" වැදගත්කම තක්සේරු කරන්න.

05. කාල්මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් ඕනෑම එක් න්‍යායකට අදාළව එහි න්‍යායාත්මක රාමුව සාකච්ඡා කරන්න,

    අ) පංති අරගලය

    ආ) ද්වන්ද්වාත්මක භෞතිකවාදය

06. "මැකියාවෙලිගේ අදහස් මගින් දේශපාලන චින්තනය නව අවධියක් කරා යොමු කළේය" ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

07. සමාජ සම්මුතිවාදී න්‍යායේ මූලිකාංග පරීක්ෂා කරන්න.

(අ. පි. බ.)

08. පහත සදහන් **ඕනෑම එක් ශීර්ෂයක්** යටතේ රචනයක් ලියන්න,

අ) ස්වාධීපත්‍යය පිළිබද ජීන් බොඩින්ගේ සංකල්පීයකරණය

ආ) නීතිය සම්බන්ධයෙන් ශාන්ත තෝමස් ඇක්වයිනාස්ගේ වර්ගීකරණය

ඇ) රාජ්‍යයේ සම්භවය පිළිබද බෞද්ධ විග්‍රහය

ඈ) යුක්තිය පිළිබද ජෝන් රෝල්ස්ගේ න්‍යාය

ඉ) කෞටිල්‍යගේ "මණ්ඩල න්‍යාය"

09. ජාර්ගන් හබමාස්ගේ දේශපාලන දර්ශනය විස්තර කරන්න.

10. පහත සදහන් **ඕනෑම මාතෘකා දෙකක්** සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න,

අ) ජෙරමි බෙන්තම්ගේ උපයෝගීතාවාදය

ආ) දේශපාලන න්‍යාය සහ දේශපාලන දර්ශනය අතර වෙනස

ඇ) දේශපාලන සහ සමාජ න්‍යායේ අර්ථය සහ ස්වභාවය

ඈ) රාජ්‍යයේ නිසි කාර්‍යභාරය පිළිබද කොන්ෆියුසියස් න්‍යාය

ඉ) සමාජ හා දේශපාලන දර්ශනය සම්බන්ධයෙන් හෙගල්ගේ සංකල්පීයකරණය